දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල, )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

මගේ අංකය ) MH/AE8/PARA/CPHI/
எனது இல) 2023/1
My No. )

ඔබේ අංකය )
உமது இல)
Your No. )

දිනය )
திகதி )
Date ) 2023.07. 17

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02-94/2023**

රේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්/ආයතන ප්‍රධානීන් වෙත,
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට බඳවා ගැනීම</u>**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්ගේ අංක HSC/PRO/PARA/06/04/2023 හා 2023.05.03 දිනැති ලිපිය මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති රේඛීය අමාත්‍යාංශය යටතේ සේවය කරනු ලබන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. අයදුම්කරුවන් විසින් තනතුරට අදාලව 2020.01.09 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව පහත සඳහන් කොන්දේසි සියල්ල සපුරා තිබිය යුතු වේ.**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. 2022.12.31 දිනට මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

IV. අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ කරුණු අංක 7.4.2.3 යටතේ දක්වා ඇති පරිදි ආචාර්ය-මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට හා ආහාර හා ඖෂධ පරීක්ෂක තනතුර දරන නිලධාරීන්ට මෙම තනතුරට ඉල්ලුම් කළ නොහැක.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

VII. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතුය.

VIII. I ශ්‍රේණියට උසස් කිරීම රේඛීය අමාත්‍යාංශය හෝ පළාත් සභා මඟින් සිදුකර තිබිය යුතුය.

IX. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**03.** අයදුම්පත් එවිය යුතු පිළිවෙල :-

I. අදාල අයදුම්පත්‍ර මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රය අනුව පමණක් සකස් කළ යුතු වේ.

II. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි <u>**"සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට බඳවා ගැනීම"**</u> යනුවෙන් සඳහන් කළ යුතු වේ.

III. මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත්වල සඳහන් කරුණු අදාල නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුලත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව සහතික කළ යුතුය. එය ආයතන ප්‍රධානියාගේ වගකීමක් වන අතර, අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ආයතන ප්‍රධානියාගේ පෞද්ගලික අවධානය යොමු විය යුතුය.

IV. සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ආයතන ප්‍රධානීන් විසින් **2023.08.04** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ (පරිපාලන-ආයතනික), 4 වන මහල - වම, සෞඛ්‍ය අමාත්‍යාංශය-උප කාර්යාලය, මෙඩිහවුස් ගොඩනැගිල්ල, නො. 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනයට එවිය යුතුය.

V. <u>ප්‍රමාද වී ලැබෙන හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u> ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ. තැපෑලේ දී සිදුවන අස්ථානගතවීම් පිළිබඳ අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

**04.** තෝරා ගන්නා ක්‍රමය :-

තනතුරුවල පවතින පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා එම කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහලම ලකුණු ලැබූවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත්කරනු ලැබේ. අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ අදාල තනතුරු දරණ නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. (අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපි ගොනු පමණක් පරීක්ෂා කරනු ලැබේ)

**05.** ලකුණු දීමේ ක්‍රමය :-

I. **ජ්‍යෙෂ්ඨතාවය (ලකුණු 60)**

I ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ සෑම එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 5 බැගින් හිමි වේ. තනතුරට අයදුම් කිරීම සඳහා අවශ්‍යවන මූලික සුදුසුකම සඳහා අදාළ කරගනු ලබන සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ)

II. **කුසලතාවය (ලකුණු 40)**

උසස් කිරීමට සලකා බලනු ලබන දිනට ආසන්නතම අඛණ්ඩ

| | |
|---|---|
| වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 40 |
| වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 32 |
| වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 24 |
| වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 16 |
| වසර 01 ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 08 |

**06.** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ඉහළම ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව සුදුසුකම් ලැබූ නිලධරයා තනතුරට පත්කරනු ලැබේ.

**07.** පත්වීම සඳහා තෝරාගනු ලබන නිලධරයා රජයට අතිරේක වියදමක් නොවන පරිදි කෙටි දැනුම්දීමකින් පත්වීම භාරගත යුතුවන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. එසේ කටයුතු කරනු නොලබන පත්වීම්ලාභියාගේ පත්වීම දින 14 කින් අනතුරුව අවලංගු කරනු ලැබේ.

**08.** මෙම නිවේදනය මඟින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත. තවද, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

එස්.ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.